# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

### නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය- SINH 18214

පළමුවන කොටසේ ප්‍රශ්නයත් දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් සපයන්න.

වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නොසතොස් නොවත්
සිරුරු පැයෙනු' ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුනයෙන් විනා

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්
ලොවට දෙන්නො ඔබ යි අහරත් පැනුත්

නද අසා ඔබ ගේ පැහැයත් බලා
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරු ලියත් ලිය - ලයි සැනැසී දියෙන්

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද උසස් නැණවත් දනො
ගුණ බරින් නැමුණෙ'වි පවතින් නිතින්

කටට ගැන්ම ද බෝමැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
"ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ" කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැයි බලන්

## 11 කොටස

02. "නවකතාවක සාර්ථකත්වයට තුඩු දෙන මුඛ්‍ය සාධකයක් වන්නේ එහි කතුවරයා විසින් විචක්ෂණශීලී ලෙස උපයුක්ත භාෂා ශෛලියයි." තත් ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

03. "කලාත්මක පරිසමාප්තියෙන් හෙබි කෙටිකතාවක් නිර්මාණය කිරීමෙහි ලා වැදගත් වන්නේ කථන මාර්ගය නොව රූපණ මාර්ගයයි." මේ මතයෙහි නිරවද්‍යතාව සනිදර්ශන ව සනාථ කරන්න.

04. "චරිත තුනක් නවකතාව, එයට පසුබිම් වූ යුගයෙහි ගැමි ජන සංස්කෘතිය පිළිබඳ ව රචකයා සතු සූක්ෂමාවබෝධය ප්‍රතිබිම්බනය කරයි." යෝග්‍ය උදාහරණ ආශ්‍රයෙන් පහදන්න.

05. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ ව රසවින්දනාත්මක විචාරයක් සපයන්න.

1. වහල්ලු
2. වතුර ටැංකිය යට හෙවන
3. කැනල් පාරේ නිශාචරයෝ
4. ජෝති

## 111 කොටස

06. නූතන මානව සමාජයෙහි සංකීර්ණ අර්බුද මාධ්‍යානුරූපී නව ප්‍රතිනිර්මාණයේ ලා කෙටිකතා රචකයන් දක්වන සාමාර්ථ්‍යය නිදර්ශනාශ්‍රයෙන් විභාග කරන්න.

07. "එස්. මහින්ද හිමි හා ආනන්ද රාජකරුණා වැනි කාව්‍ය රචකයෝ වැඩිහිටි මෙන් ම ළමා පාඨක ප්‍රජාව ද අරමුණු කරගනිමින් කාව්‍ය නිර්මාණයට පරිශ්‍රම දැරූහ." සනිදර්ශන ව පහදන්න.

08. කොළඹ යුගයෙහි දෙවන පරපුරට අයත් කවීන්ගේ පද්‍ය රචනාවන් හි විද්‍යමාන වස්තුවිෂයක විවිධතා හා විචිත්‍රතා කවරේදැයි නිදර්ශනාත්මකව විභාග කරන්න.

09. 'සාමූහික කලා මාධ්‍යයක්' ලෙස නාට්‍යය හැඳින්වීමට තුඩු දෙන සාධක කවරේ දැයි සමාලෝචනය කරන්න.

10. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මනමේ නාට්‍යයේ දී කුමරියගේ චරිතය ප්‍රතිනිර්මාණය කළ ආකාරය විමසන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි.)

************************************